**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය**
**ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය පුරප්පාඩු**

**1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත මගින් ස්ථාපිත කර ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් වන අතර, සෑම සුක්කානමක් පසුපසම නීරෝගී රියදුරෙකු බිහි කිරීම අපගේ අරමුණ වේ. ප්‍රවාහන වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වශයෙන්, අප ආයතනය ඉහත අරමුණ සාක්ෂාත් කර ගැනීමට වෘත්තිකයන්ගේ දායකත්වය අවශ්‍ය බැවින් පහත පුරප්පාඩු තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීමට ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**වෛද්‍ය ඔඩර්ලි, රසායනාගාර සහයක, කාර්යාල කාර්යය සහයක/කම්කරු සහ සනීපාරක්ෂක කම්කරු**

**සුදුසුකම්**

1. **වෛද්‍ය ඔඩර්ලි - PL 2 - බාහිර අයදුම්කරුවන්**

    1. තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප් රවීණතා සහතිකයක් ලබා තිබීම.

    හෝ

    2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන තුනක් (03) සහිතව විෂයයන් හය (06) කින් සමත්වීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් අතුරින් අංක 01 හෝ 02 හෝ 03)**

1. අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන, වෘත්තීය පරීක්ෂණයක (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ශ්‍රේණියක සේවකයින්.
2. එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම
3. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන තුනක් (03) සහිතව විෂයයන් හය (06) කින් සමත්වීම
4. සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.
5. නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

- **වයස :-** අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- **සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය :-**

| | |
|---|---|
| වැටුප් පරිමාණය<br><br>කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 II උපලේඛනයේ පරිදි වැටුප් ගෙවීම හා තනතුරට අදාළ අනෙකුත් දීමනා හිමි වේ. | PL 2<br>රු. 25,750-10×270-10×300- 10×330-12×350-38,950 |

2. **රසායනාගාර සහයක - PL 1**
3. **කාර්යාල කාර්යය සහයක/කම්කරු - PL 1**
4. **සනීපාරක්ෂක කම්කරු - PL 1**

**බාහිර අයදුම්කරුවන්**

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීම හා විෂයන් 02 ක් වත් අවම වශයෙන් සමත්ව තිබීම

- **වයස :-** අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය.
- **සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය :-**

| | |
|---|---|
| වැටුප් පරිමාණය<br><br>කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 II උපලේඛනයේ පරිදි වැටුප් ගෙවීම හා තනතුරට අදාළ අනෙකුත් දීමනා හිමි වේ. | PL 1<br>රු. 24,750-10×250-10×270- 7×300- 15×330-37,000 |

**ඉහත තනතුරු සඳහා අවශ්‍ය පොදු සුදුසුකම්:-**

සෑම අයදුම්කරුවෙකුම,

i ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

සුදුස්සන් තෝරා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සතු වේ.

සියළුම ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් සකස් කර අදාළ සහතිකවල සහතික කළ පිටපත්ද සමග ඥාති නොවන දෙදෙනෙකුගේ නම, ලිපිනය, දුරකථන අංකය සහිතව පහත ලිපිනයට 2019/09/06 දින හෝ ඊට ප්‍රථම අයදුම් කරන තනතුර ද ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සභාපති,**
**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය,**
**අංක 170, හයිලෙවල් පාර,**
**නුගේගොඩ.**
**දුරකථන :- 011 2812796 011 2852868**
**ෆැක්ස් :- 011 2809305**
**ඊ මේල් - ntmi@sltnet.lk**

**Source: www.ntmi.lk (2019.08.30)**